# ජනාධිපති කාර්යාලය
# சனாதிபதி அலுவலகம்
# PRESIDENTIAL SECRETARIAT


මගේ අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/6/1 චක්‍රලේඛ අංකය : පීඑස්/සීඑස්ජ්/චක්‍රලේඛ/31/2020

2020 ඔක්තෝබර් මස 05 වන දින

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියළුම රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්**

**සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්**

**සියළුම රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්**

**විෂයයන් හා කාර්යයන් පැවරීම**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 (1) සහ 44 (2) ව්‍යවස්ථාවන්ට අනුකූලව හා "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශය පදනම් කර ගනිමින් අමාත්‍ය මණ්ඩලයේ සියලුම අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් සඳහා විෂයයන් හා කාර්යයන් වෙන්කිරීමෙන් පසුව, අදාළ අමාත්‍යාංශ සමගින් කරනු ලබන එම කාර්යයන් සමාලෝචනය කිරීමේ කටයුතු අවසන් වෙමින් පවතී.

ඒ අනුව, අදාළ ගැසට් නිවේදනයේ දක්වා ඇති පරිදි, එක් එක් අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශයන්හි විෂයපථය, කාර්යයන් හා කාර්තව්‍යයන් මෙන්ම සුවිශේෂී ප්‍රමුඛතා හා එක් එක් අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද, ඒවාට අදාළ නීති හා අණපනත් ද සැලකිල්ලට ගෙන ඇති අතර, ආශ්‍රිත කටයුතු බලාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් වෙත පැවරෙන වගකීම සහ අමාත්‍යාංශ ලේකම්වරුන් හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත පැවරෙන පරිපාලනමය හා මූල්‍යමය බලතල ද විස්තරාත්මකව එම නිවේදනයේ දක්වා ඇත.

තවද, රජයේ ඉහළම පරිපාලන හා කළමනාකරණ ස්ථරය නියෝජනය කරන ඔබ වෙත පැවරී ඇති වගකීම් හා ඉලක්කයන් නිවැරදිව හඳුනා ගනිමින් "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් අරමුණු ඉටු කරලීම පිණිස උක්ත නිවේදනය මගින් ඔබ වෙත වෙන්කර දී ඇති කාර්යයන් විෂයභාර අමාත්‍යවරයා ගේ නියෝග හා උපදෙස් මත අදාළ නීතිමය රාමුව තුළ ඉටු කිරීම ඔබ ගේ වගකීම බව පෙන්වා දෙමි.

එහිදී උක්ත විෂයයන් හා කාර්යයන් පැවරීම් නිවේදනයෙහි සඳහන් කරුණු නිසි පරිදි අවබෝධ කරගනිමින්, අමාත්‍යාංශය තුළ ඇති රාජ්‍ය අමාත්‍යාංශ මෙන්ම අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණය කර ගනිමින්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන් කටයුතු කිරීමේ අවශ්‍යතාව ද පෙන්වා දීමට කැමැත්තෙමි.

ජනතා කේන්ද්‍රීය සංවර්ධන හා පාලන ක්‍රමයක් සඳහා "සෞභාග්‍යයේ දැක්ම" රජයේ ප්‍රතිපත්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඔබ සැමගේ රාජකාරියෙහි ඒකායන අරමුණ වන අතර, ඒ සඳහා සියලු නිලධාරීන් සාමූහිකව කටයුතු කිරීම අත්‍යවශ්‍ය බව ද අවධාරණය කරමි. එහිදී අවශ්‍ය වන මානව හා භෞතික සම්පත් අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ හා රාජ්‍ය අමාත්‍යාංශ අතර විධිමත් පරිදි වෙන්කර ගැනීම අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ගේ හා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයා ගේ සාමූහික වගකීමවේ.


ගාලු මුවදොර, කොළඹ 01 / காலி முகத்திடல், கொழும்பு 01 / Galle Face, Colombo 01
දුරකථන / தொலைபேசி / Telephones: ++ 94 (0) 11 2354418, ++ 94 (0) 11 2473873
ෆැක්ස් / தொலைநகல் / Fax: ++ 94 11 2446657
ඊ-තැපෑල / மின்னஞ்சல் / e-mail: prsec@presidentsoffice.lk

ඒ අනුව, යම් රාජ්‍ය අමාත්‍යාංශයක් වෙත අතිගරු ජනාධිපතිතුමා විසින් පවරා දී ඇති විෂයපථය තුල කාර්යයන් හා කර්තව්‍යයන් හා සුවිශේෂී ප්‍රමුඛතා ඉටු කරලීම සඳහා එම රාජ්‍ය අමාත්‍යාංශ වෙත පවරා දෙන ලද ආයතන හැරුණු විට අදාළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශයෙහි යම් යම් අංශයන්හි සෘජු දායකත්වය ද අවශ්‍ය වන අවස්ථා පැන නැගිය හැකි අතර, එහිදී එකී කාර්යමණ්ඩල හා අනෙකුත් භෞතික සම්පත් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යයන් සඳහා ලබා දීම කළ යුතුවේ.

තවද, රාජ්‍ය අමාත්‍යාංශ වෙත යම් යම් ආයතනයන් පවරා දී ඇත්නම්, එකී ආයතනයන්හි කාර්යයන් රාජ්‍ය අමාත්‍යාංශයේ විෂයපථය තුල ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් අවකාශ ලබා දිය යුතුවේ. තවද, සේවා අවශ්‍යතාව මත කාර්යභාරයන් ප්‍රතිසංවිධානය කරගනිමින් හා බඳවා ගැනීම් පටිපාටියක් තුළ, වෙන්කර ඇති ප්‍රතිපාදන යොදා ගනිමින් අනුමත කාර්යමණ්ඩල බඳවා ගැනීම් විධිමත්ව කරගැනීමට අදාළ උපදෙස් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කිරීමට අවශ්‍ය උපදෙස් දී ඇත.

අමාත්‍යාංශ ලේකම්වරුන් ප්‍රධාන, රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් හා ආයතනික ප්‍රධානීන්ට සුවිශේෂ අධීක්ෂණ වගකීමක් ද පැවරෙන බැවින් සිය අමාත්‍යාංශ හා ආයතනවල ක්‍රියාත්මක වන විවිධ සේවා මධ්‍යස්ථාන ජනතා අවශ්‍යතා අනුව ක්‍රියාත්මක වන බවට වග බලා ගැනීම සහතික කිරීම් වස් එම ආයතන නිරන්තරයෙන් අධීක්ෂණය කල යුතු අතර, එම සේවා ස්ථාන පෞද්ගලිකවම හෝ ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක්කොට, එම කාර්යාල වල හා ක්ෂේත්‍ර මට්ටමේ නිලධාරීන් කාර්යක්ෂම ලෙස සේවා සපයන බව සහතික කිරීමට ද වග බලා ගත යුතුය.

සෑම සතියකම මහජන දිනය තුළ සියලුම නිලධාරීන් කාර්යාලය තුළ රැඳී සිට සේවා සැපයීම් කළ යුතු වන අතර, එම දිනයේ බාහිර රැස්වීම්, නිවාඩු ලබා ගැනීම් වැනි කටයුතු වලින් වැළකී සිටීමට ද වග බලා ගත යුතුය.

රජයේ ඉහළ පරිපාලන හා කළමනාකරණ ස්ථරය වන ඔබ විසින් ඉහත තත්ත්වයන් කෙරෙහි නිසි අවබෝධයෙන් හා අවධානයෙන් යුතුව, ජනතා අපේක්ෂාවන් ඉටුවන ආකාරයෙන් කාර්යක්ෂම නිලධාරියෙකු ගේ භූමිකාව නිර්මාණශීලි ලෙස ඉටු කිරීමේ අවශ්‍යතාව අතිගරු ජනාධිපතිතුමා විසින් දැඩිව අවධාරණය කරනු ලබන අතර, අවශ්‍ය අවස්ථාවන්හිදී ඒ සඳහා නිසි උපදෙස් හා මගපෙන්වීම මෙම කාර්යාලය මගින් ලබා දීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ද සකස් කර ඇත.

එබැවින්, සිය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන් අදාළ අමාත්‍ය මණ්ඩලයේ ගරු අමාත්‍යවරුන් හා රාජ්‍ය අමාත්‍යවරුන් ගේ විධානයට හා මගපෙන්වීමට යටත්ව මෙහෙයවමින් අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා ඵලදායී මෙහෙවරක යෙදෙන ලෙස අතිගරු ජනාධිපතිතුමා ගේ උපදෙස් පරිදි දැනුම් දෙමි.

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්